# නිහාල් ශ්‍රී අමරසේකර

*සාමාජික*
වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකාවේ)
වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (එක්සත් රාජධානියේ)
සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (ඕස්ට්‍රේලියාවේ)
සහතිකලත් වංචා පරීක්ෂකවරුන්ගේ සංගමය (එක්සත් ජනපදයේ)
රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ජාත්‍යන්තර සන්ධානය
දූෂණ විරෝධී ජාත්‍යන්තර අධිකාරීන්ගේ සංගමය


2011 නොවැම්බර් 08

සිංහල පරිවර්තනයකි.

<u>අතිනි (ඇමුණුම් සහිතව) / ෆැක්ස් මගිනි.</u>

ගරු චමල් රාජපක්ෂ,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායකතුමා,
ශ්‍රී ජයවර්ධනපුර,
<u>කෝට්ටේ.</u>

ගරු කථානායකතුමනි,

*හොටෙල් ඩේවලපර්ස් (ලංකා) ලිමිටඩ් - කොළඹ හිල්ටන් හෝටලය.*
*2007 අංක.7 දරණ සමාගම් පනතේ **X** කොටස යටතේ වැඩ පිළිවෙලක් සහ සමථයක් සඳහා අද,*
*2011.11.08 දින බස්නාහිර පළාතේ (සිවිල්) මහාධිකරණයට ඉදිරිපත් කරන ලද*
*<u>අංක.52/2011/**CO** දරණ ඉල්ලීම.</u>*

සමාගමක ප්‍රති වැඩ පිළිවෙලක් සහ සමථයක් සඳහා අදාළව යෙදෙන සාමාන්‍ය සහ වෛසික නීතිය වන 2007 අංක.7 දරණ සමාගම් පනත යටතේ සහ එහි නියමයන් අනුව බස්නාහිර පළාතේ (සිවිල්) මහාධිකරණයේ අධිකරණමය බලයේ පිළිසරණය පතමින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් ඉල්ලීමේ ගොනුකරණ ලද පෙත්සමේ පිටපතක් මෙයට යා කරමි.

2011.10.20 දින සිට 2011.11.04 දින දක්වා මා විදෙස් ගතව සිට ආපසු පැමිණිවිට දී, 2010.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉහත සඳහන් සමාගමේ මූල්‍යම තත්වය මාගේ කාර්යාලයට <u>2011.11.02</u> දින ලැබී තිබුණි බව දැනගන්නට ලැබුණි. ඒ නිසාවෙන් ක්ෂණිකවම මම අධිකරණයේ පිළිසරණය පතා සිටියෙමි.

මේ අනුව, ඉහත සඳහන් සමාගමේ ප්‍රති වැඩ පිළිවෙල සහ සමථය පිළිබඳව වන කාරණය ගැන කටයුතු රටෙහි සාමාන්‍ය වෛසික නීතියට අනුකූලව අධිකරණය විසින් කරනු ඇති අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහනම් කර ඇති ජනතාවගේ පරමාධිපත්‍යය බැහැර කිරීමකට තුඩු දෙන්නාවූ, එවැනි අයිතියක් සහ/හෝ බලයක් පිළිබඳව අතිවිශේෂ සහ/හෝ අත්තනෝමතික ක්‍රියාවලියක් යටතේ වෙනත් කාර්යාංශයක්, විධායකය මගින් කටයුතු කිරීමට කිසිසේත්ම පැවරීමක් කළ නොහැක. ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ සත් (7) පුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් කරන ලද විනිශ්චයයන් හී පහත දැක්වෙන ප්‍රොක්තය බලන්න.


167/4 විපුලසේන මාවත, තැ.පෙ. 1796, කොළඹ 10, ශ්‍රී ලංකාව
දුරකථන: 2696814, 2686364, 4715988 ෆැක්ස්: 2697134 (මහනුවර දුරකථන / ෆැක්ස්: 4470442)
ඊ-මේල් : consultants21@gmail.com

හිමිකම් පවරා ගැනීම වැනි ජාතික හා පොදු වැදගත්කමකින් යුතුවන කාරණයක් සම්බන්ධයෙන් ජනතා අදහස් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ඇසීමට යොමු කිරීමේ පුරුවැසියාගේ ව්‍යවස්ථානුකූල අයිතිය ඊමගින් දුර්මුඛ කරමින්, ''හදිසි පනත් කෙටුම්පතක්'' වශයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට ඉදිරිපත් කර තිබුන ''හිමිකම් පවරා ගැනීමේ පනත් කෙටුම්පත'' පිළිබඳව මම විදෙස්ගතව සිටි නිසා සම්පූර්ණයෙන්ම දැන නොසිටියෙමි. එය හදිසිතාවයක් වරම් කරන ජාතික ව්‍යසනයක් වූයේ නම් මිස, අත්තනෝමතික ලෙස ක්‍රියාත්මක කිරීමේ මුක්ත බලයක් අමාත්‍ය මණ්ඩලයට නොමැත.

ගෙනහැර දක්වා ඇති හේතු තත්වයන් මත, පූර්වාදර්ශයක් ලෙසට පවතිතැයි මම විශ්වාස කරන ව්‍යාර්ථ වුන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 18 වන සහ 19 වන සංශෝධනයන් මත ශ්‍රේෂ්ඨාධිකරණයේ සත් (7) පුද්ගල විනිසුරු මඩුල්ලක් විසින් 2002 ඔක්තෝබර් මස දී කරන ලද විනිශ්වයන් වලින් පහත දැක්වෙන ප්‍රොක්තය මම උපුටා දක්වමි. ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු මඩුල්ල එවකට අගවිනිසුරු සරත් එන්. සිල්වා, (කලින් අගවිනිසුරු) ජේ.ඒ.එන්.ද සිල්වා, (වත්මන් අගවිනිසුරු) ශිරානි බණ්ඩාරනායක, විනිසුරු එස්.ඩබ්ලිව්.බී.වඩුගොඩපිටිය, විනිසුරු අයි.ඉස්මයිල්, විනිසුරු ඒ.එදිරිසූරිය සහ විනිසුරු එච්.එස්.යාපා ගෙන් සමන්විතය. ඔබතුමාගේ පුස්තකාලයේ එම විනිශ්වයන්හි පිටපත් ඇතැයි මට විශ්වාසය.

- ''එබැවින් ව්‍යවස්ථානුකූල නීතියෙහි සහ දේශපාලනමය න්‍යායයන්හි සියළු සශ්‍රීකත්වයන් ඉවතලා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අදාළ ව්‍යවස්ථාවල සරල අර්ථ නිරූපනයක් කළ කල්හි, රජයේ එක් කාර්යාංශයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් විශේෂණයක් කර ඇති යම් බලයක් රජයේ වෙනත් කාර්යාංශයකට පැවරිය නොහැකි වන අතර එම කාර්යාංශයකට විසින් අතහැර දැමිය හෝ එයින් ඉවත් කිරීමක් කළ නොහැකි වන අතර එවැනි යම් පැවරීමක්, අතහැර දැමීමක් හෝ ඉවත් කිරීමක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සමඟ කියැවෙන 3 ව්‍යවස්ථාවට අසංසන්දය වන පරමාධිපත්‍ය 'බැහැර' කිරීමක් වනු ඇත.''

- ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පෝෂිතව සුරැකිව පැවතෙන්නට නම්, එවැනි එක් එක් කාර්යාංශයකට විශේෂණය කර ඇති බලය හා සම්බන්ධයෙන් රජයේ කාර්යාංශ 3 අතර රඳවා ඇති සංතුලනය රැකගත යුතු බව එයින් අවශ්‍ය ලෙසින්ම අනුකරණය වේ.''

- ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් රජයේ එක් කාර්යාංශයකට විශේෂණය කර ඇති බලය වෙනත් කාර්යාංශයකට පැවරීම හෝ එවැනි බලයක් අතහැරීමට හෝ ඉවත් කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 4 වන ව්‍යවස්ථාව සමඟ කියැවෙන 3 වන ව්‍යවස්ථාව අසංසන්දනය වන පරමාධිපත්‍ය බැහැර කිරීමක් වනු ඇත.''

- ''අනිත් අංශයක් හා සම්බන්ධ පිරික්සුමක් සංස්ථාපිත වන බලයක් විශේෂණය වන එක් අංශයක් අවශ්‍ය වන විටකදී සියළු කල්හිම පෙනිය යුත්තේ අවශ්‍යයෙන්ම බලය ක්‍රියාත්මක කරනු ලබන්නේ ජනතාව වෙනුවෙන් භාරකාරත්වයකින් යුතුවන බවය. නව සංකල්පය මෙය නොවන්නේ ය. පොදු නීතියේ පාදක පූර්වාවයවය වන්නේ බලය නිරපේක්ෂව නොව භාරකාරත්වයකින් යුතුව දරණ බවය. එංගලන්තයේ පරිපාලන නීතියේ දර්ශණයෙන් බලය ප්‍රදානය කිරීමෙහිලා ව්‍යංගය වන 'භාරය' මෙසේ ප්‍රකාශ කොට ඇත:

*පොදු අරමුණු සඳහා ප්‍රදානය කරනු ලැබ ඇති ව්‍යවස්ථාපිත බලය පවරනු ලබන්නේ භාරකාරත්වයකින් යුතුව වන ලෙසටය. අවිශේෂව නොවේ - ඒ කියන්නේ, එය වලංගු ලෙස භාවිතා කළ හැක්කේ පාර්ලිමේන්තුව එය ප්‍රදානය කිරීමේ දී අපේක්ෂා කළ අරමුණ පිළිබඳව පූර්වානුමානයකින් යුතුව හරියාකාරව සහ නිසි ලෙසය. - (පරිපාලන නීතිය 8 කාණ්ඩය 2000 - එච්.ඩබ්ලිව්.ආර්.වේඩ් සහ සී.එෆ්.ෆෝර්සයිත් 356 පිටුව)''*

- '' 'නීතියේ ආධිපත්‍ය අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පදනම වන බවට, මෙම අධිකරණය විසින් නඩු තීන්දු ගණනාවකම තරයේ ප්‍රකාශ කොට ඇත.''

- ''ආණ්ඩුක්‍රනම ව්‍යවස්ථාවේ මූලික මූලධර්මයන් ලෙසට සැදී ඇති නීතියේ ආධිපත්‍යට තේරුම් තුනක් ඇති බව ඒ.වී.ඩයිසි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සඳහා නීතියේ උපග්‍රහණය කොට ඇති අතර, එයින් එකක් විස්තර කර ඇත්තේ මෙසේ ය.''

  ''මුලින්ම එහි තේරුම් වන්නේ, අත්තනෝමතික බලයේ බලපෑම්වලට එදිරිවාදීව සම්මත නීතියේ පරම ශ්‍රේෂ්ඨත්වය හා විශිෂ්ඨත්වය වන අතර අත්තනෝමතිකත්වය හෝ පරමාධිකාරිය පැවතීම හෝ රාජ්‍ය පාර්ශවය පුළුල් අභිමතානුකූල බලයේ පැවතීම පවා එයින් බැහැර කොට ඇත. ඉංග්‍රීසි ජාතීන් පාලනය වන්නේ නීතියෙන් සහ නීතිය මඟින් පමණී.''

  ..............

- ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ව්‍යුහය හරහා දිව යන එක මූලධර්මයක් වේන්නම් එය නීතියේ ආධිපත්‍යයේ මූලධර්මයය වන අතර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ, රජයේ සියළු කාර්යාංශයන් නීතියේ සීමාවන් තුළ රඳවා ගැනීමේ කර්තව්‍ය පවරා ඇත්තේ අධිකරණය මත වන අතර එමඟින් නීතියේ ආධිපත්‍ය තේරුම් සහිත සහ කාර්යක්ෂම කර ඇත. ඉන්දියානු නඩු තීන්දුවකින් උපුටා දක්වා ඇත.''

- ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්ථාපිත කරන මොනයම් අධිකාරියකට හෝ ආයතනයකට මුක්ත අභිමතයක් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආරෝපණය කර නැත.''

- ''ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ආරක්ෂාකර පිළිපැදීමට ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ හතරවන උපලේඛණයේ නියමයන් අනුව ගාම්භීරතා පූර්වකව ප්‍රතිඥා දී ඇති අපි, ඒ අනුව මෙම ප්‍රතිපාදනය බලාත්මකව ක්‍රියාත්මක කළයුතුය.''

මහජනයාට එම කාලසීමාවේදී පනත් කෙටුම්පත නොලැබී තිබියදී, දින 7 ක පටු කාලසීමාවක් ඇතුළත මවිසින් මාගේ අභියෝගය ඉදිරිපත් නොකිරීම නිසා සමස්ථ ලෙස වැටළුනු බදු සිමාවකට පුරවැසියෙකු වශයෙන් කළ මාගේ අභියෝගය ශ්‍රේෂ්ඨාධිකරණය මගින් ඇසීම සිදුකිරීම මට අහිමිකළ බව ඔබතුමාට මතක ඇත.

පසුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 129 ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මත ප්‍රකාශයක් කිරීම සඳහා යොමු කිරීම එවකට ජනාධිපතිතුමිය පොළඹවවන ලදුව, එහිදි මම විස්තීරණ සැළකිරීමේ ඉදිරිපත් කිරීමෙන් එය, වෙනත් දේ අතර, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශයට සහ සිවිල් සහ දේශපාලන හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය කඩකර ඇතැයි සහ සමාවක් ප්‍රදානය කර ඇත්තේ නීතීන් උල්ලංඝනය කළ

අයවළුන්ට බවත්, එමගින් රජයට බරපතල පාඩු සිදුකරමින් මහජන ආදායම් වංචා කර ඇති බව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණයක් ප්‍රකාශ කරන ලදී.

පූර්වෝක්ත හේතු තත්වයන් මත, බැහැර කළ නොහැකි පරමාධිපත්‍ය ජනතාව සතුව තිබියදී ජාතියට සහ ජනතාවට එයින් ආනුෂංගික බලපෑම් තිබියදී ද, නීති සම්පාදනය කිරීමේ ක්‍රියාවලියේදී අදහස් ඇසීමට යොමු කිරීමේ ජනතා අයිතිය ප්‍රශ්නයට තුඩුදෙන අයුරින් පුරවැසියන්ට අහිමි කරන්නේ මන්දැයි වටහා ගැනිම උගහටය.

මෙයට - විශ්වාසී,

නිහාල් ශ්‍රී අමරසේකර

<u>පිටපත්</u>

අගමැතිතුමා

විපක්ෂනායකතුමා

සභානායකතුමා